# වසත් සුළඟ

kavi.dinamina@lakehouse.lk

**ලිපිනය -**
**35, ඩී.ආර්. විජයවර්ධන මාවත,**
**ලේක්හවුස්, කොළඹ.**



## මුදුව සිප සනසමින්

මඳ පවනක් සේ හමා
මුමුණ මුමුණා රහසේ
දැවැටි දැවටී කිතිකවා
මුදුව සිප සනසමින්
හොවා සිසිලේ මඳක්
ඇදී යයි නොකියාම ඔබ
සුවඳ පමණක් තබා

**අමිතා පද්මකුමාරි**

## මමත් සක්විති පදවි ලැබුවා

තිඹිරිගෙය තුළ
උපන් දා සිට
සිය දහස් වර
උරෙහි හිඳුවා.
මමත් සක්විති
පදවි ලැබුවා
පුතෙක් ඉපදුන
ප්‍රීතියෙන් ...

උස් මහත් වී
නුඹේ කරදඬු
දඟකාරකම්
කරන විටදී
තුටු කඳුලු මගෙ
නෙතින් ගැලුවා
පුතේ ඒ
අභිමානයෙන් ...

රකින්නට රට
යුදෙට ගිය දා
කරන දස්කම්
ආසා සැමදා
මමත් හිටියෙ
පුතෙක් විරුවෙක්
නිසා වූ
ආඩම්බරෙන්...

සතුරු වෙඩි සර
පපුව විනිවිඳ
ගියායැයි සැල
වුණත්.හිටියේ
ලොවම අභිමුව
දරාගෙන දුක
කඳුලු නොසලා
ශෝකයෙන්...

පුතේ උරයෙහි
දරාගෙන දෙන
යනවිටදී නොදැනීම
දෙනෙතින්
ගලා හැලුනා
කඳුලු ඒනම්
දරාගන්නට
බැරි දුකෙන් ...

**ප්‍රසන්න මංජුල**



## නූතන ගජමන්

පාට පාට හීන රැසක්
දුර ඈතක දිසේ
රෑට රෑට හීගතුවත් ලාවා
ලෙස පැසේ
ගාට ගාට ආ තනිකම
තිත්තෙත් පැණි රසේ
කාට කාට මල් පිපුණත්
වාවා ගම් තොසේ

මාල පොටක ප්‍රාර්ථනා
සේදී වැහි දියේ
කාල තුරඟසෙන් ඉරණම
කටුගාගෙන ගියේ
නීල කොබෙයියනි පැදුරේ
වී ඉතිරිව තියේ
ආල කතා පුන්සිසිගෙන්
අහවර නැත රැයේ

මල් කඩුපුල් ගනදුර මැද
සුදු හසරැලි පානා
විල් නිල්ලට අඹරෙන් වට
සඳකැන් දිය ගේනා
දැල්වෙන කණාමැදිරි තිතෙත්
රන් පානක් පේනා
කල් මරමින් ආ ගමනකි
මං ගජමන් නෝනා

රට්ටු පාන ඔච්චමකට
දුක උහුලා ගම්
කිට්ටුම හද හමුවෙනතුරු
බොරළු මැදින් යම්
වෙට්ටු දාන සුළං රොදට
සීරුවෙ සැඟවෙම්
මට්ටු වෙච්චි හිත හදාන
තනි පාඩුවෙ ඉම්

**මහගම සීලානන්ද හිමි**

## රිදී පාට උදා හිරු

මකා අඳුර -පෙරා කිරණ
රිදී පාට උදා හිරුට
ඉඩ හරසර ලබාදෙන්න
රොඳ බැඳ උන් තරු පිරිවර
නීල අහසේ ගියා දුරට

**විමල් සිරිමා ගමගේ**



## අලුත් දවසක්

මීදුමෙන් වැසී ඇති
දුර ඈත ආකාසෙ
හිරු කුමරු සිනාසෙයි
ළපලු කැකුළක් ලෙසින්
අතුමතින් රඟ දෙමින්
විහඟුන්ද සිනාසෙයි
සුදු කොකුන් රෑන මෙන්
ළමුන් අකුරට දුවයි
බෝ ගසේ සිලි හඬින්
නිවා සනහයි සිතත්
සොඳුරු දිනයක් තවත්
මේ ලෙසින් උදාවෙයි

**කුමාරි ප්‍රේමරත්න**



## සුදු යකඩ මුදුව කෝ

සුළඟිල්ලෙ පැලඳවුන්
සුදු යකඩ ගණ මුදුව
මැදඟිල්ල සොයාගෙන
ගියපු ඉර මැදියමේ...

කෙටි වෙන්න කපා තිබු
නුඹෙ කැරලි කොණ්ඩයත්
උරහිසත් සොයා ආ
රාස්සිගෙ අවි කට්ටෙ..

කඩවසම් මුහුණකට
ගැළපෙන්න තිබු රැවුල
අසෝබන ලෙස
දික් වෙලා
සිනාසුණ මැදියමේ....

සෝද සෝදා ඇඳපු
දම්පාට කමිසයත්
ගැලවිලා නෙක වර්ණ
ඇදෙන උණුසුම් උදේ...

කාසි සිල්ලරවලට
රාගයට මායමට
විසි වෙලා සේදිලා
ඉඳුවර වූ ප්‍රේමයම
වැස්ස වැටෙනා වෙලේ

**පවිත්‍රා සෙව්වන්දි උඩුවර ආරච්චි**



## නොවෙද දස්කොන්

සහස් බැඳි පෙම් හිතක් වුවද
රහස් පහසේ වෙලී උන්නද
දහස් හිස් දුන් රජවරුන් මැද
ම'හිස් පුද දෙමි සෙනහසින් බැඳ

පවුරු පදනම් නොවේ මිණි දොර
නුඹේ හිමිසඳ උනත් මොහොතක
විහඟ පෙම් ගී විරහ වූවද
නොවෙ ද මේ තල රහස් පෙම් බැඳ

නුඹේ රතැඟිලි දිවූ මා හිස
කඳින් වෙන් කළ හැකි වුවත් අද
දයාබර වූ හිතක් ඇති මම
නොවෙද දස්කොන් නුඹට පෙම් කළ

**සංඛ සමරප්පුලි**

## ගැහැනු

හිතාගෙන හිටියේ
පමණක් ම
ගත හැකි බව
මිටට
සිහිනිඟ...
හිතුවේම නැහැ නේද
ගත හැකි බව
මිටට...

**ශ්‍රීමානි ප්‍රියංගිකා**



## ටිකක් දුර ගමනක්

ඉඩදී හඳට ඩිංගක්
ඉර යයි
ටිකක් දුර ගමනක්.,
ඉතින් මෙතරම්
විසල් අහසක්
පුරවන්න හැකිවෙයිද
ඉස්සාට තරු අහුරක්..!

**තිළිණ ගාල්ලගේ**

## මිනිසාද සත්වයෙකි

සටකපට සිතිවිලි
සමග රමණයෙ නියැළෙති
තිරිසනුන් විස ඇතී
තවුසන් විලස හැසිරෙතී

පන්සලද පල්ලියද
කෝවිලද ගැවසෙතී
මුව මුකුළු ලතාවෙන්
උවසුවන් විලසිනී

සිතේ නැති කුලුනු ගුණ
වතේ සිතුවම් ඇදී
මිනිසාද සත්වයෙකි
නේක හැඩවැඩ ඇතී

**පැතුම් බුද්ධික ලියනගේ**

## නුවරඑළියේ තැපෑල

ඇසූවිට එම පුවත - සසල වුනි මගේ සිත
අපේ ඒ උරුමයන් - අහිමි වේදැයි සිතුනි
පක්ෂ පැති මුකුත් නැත - සුභ පතමි මැති ඔබට
නැවත ගෙන දුන්නාට - ඔවුනගේ උරුමයම

**රේණුකා කුමාරි ජයවර්ධන**

## මගේ උණුහුම ඇතිද

මගෙ පුතුනේ රස මසවුළු ගෙනෙමි කියා
රවටා පුංචි සිත මම මෙහි ආවේ අඬා
නුඹ මතු දිනක රජ කරවන සිහින දරා
නිදි නැති දවස වැඩ කර නම් වෙහෙස දරා

සිහිනය අතර අම්මව නුඹ හොයනවද
අත්තම්මා තුරුලේ මගේ උණුහුම ඇතිද
සිහිවන විටදි නුඹ සුරතල් මුව කමල
හදවත පැළෙන්නට තරමට දුකයි මට

හුරතල් වදන් එක් කරමින් කතා කර
අම්මා ළඟින් සිටියම යුතු කාලෙ මෙය
දිවි බර වැඩියි උහුලනු බෑ රුදුරු බව
අයදිමි පුතුනෙ සමාව මම අහිමි පෙම

**නෙත්මිණී සෙනෙවිරත්න**



## ඔහු සීරෝ නුඹ හීරෝ

ඔහු ලස්සනට රඟපෑවා
ඕඩියන්ස් එකත් ක්ලැප් කළා
මම ඇත්තටම රැවටුණා
නුඹ මාව බේරුවා

**සුධර්මා සමරසේකර**

## අම්මා



පැන ගියත් සුදු නෙළුම්
අරන් ආ ඇත්තූ

තනි කළේ නෑ "මවක්"
කිසිම දා පුත්තූ

**නිමේෂා ජයසුන්දර**

## යනවා දුටුවෙ vogගෙ දොර ඇරලා

කැපුවත් ඔබෙයි ආලය පැයකුත්    මැරිලා
කීවත් රසට දිව හැරවෙන පැත්ත    බලා
හැදුනෙන් ඔබේ සිදුරක් පපු ගැබ    පැළිලා
සොඳුරිය හොඳින් ඉනුමැන දිවිතෙක්    වසලා

එලිසින් කියා නික්මුණ සඳ කඳුළු    සලා
නිකමට හොයා බැලුවේ මැරුණාද    කියලා
සුරතක් බදා මුකුළුව හා අඩි    තියලා
යනවා දුටුවෙ vogගෙ දොර    ඇරලා

හිල්වූ පපුව වරමක් සුව    කරන්ටැතී
නැවතත් සොයා මා හමුවට    එන්ටඇතී
මුහුණක් දෙන්න බැරිවම යළි    හැරෙන්ටැතී
එලෙසින් සිතා මා ඉන්නව    සිතන්ටැතී

දුටුවත් ඉඳහිටක මඟතොට    අතරමග
ඔච්චම් නැගෙයි වසනා තුරු    සසරමග
බැලුවොත් හැරී නිකමට සේ    ආව මග
මව්තුම් තමයි සිහිවෙන්නෙ    අනේ සග

**ඉශානි ඉන්දිකා ජයලත්**



## වේලී සිඳී ගොස් ඇත

පීන නෑ පයෝදර
වැලට එල්ලී ඇති හෙයින්

නොතෙත් වෙන රතදරද
වේලී සිඳී ගොස් ඇත මායිමෙන්

නිමිති හෙව්වට ගෑනු ඇඟ තුළ
අතට පමණක් දැනුනොතින්

තෙත් කරන්නට හැකිය
උඹ හට නාකපන වැස්සක වෙසින්

**කුමාරි දසනායක**

## මාගේ හංස ධේනුව

කැලණි විහාරය දෙසින්
සැඳෑ අඳුර ගාටන විට සරසවියට
ගල් බංකුවේ වාඩි කරවාගෙන නුඹ
කාටත් නොපෙනෙන්න කෙනිත්තූ
තිසර තන නැත අද

දුකක් දැනී මා කඳුළු සලන විට
පෙම්බස් දොඩා නිරතුරු
මවක ලෙස මා ළයේ හොවා
දාහක් ගින්දර නිවූ
පිනැති උස් ළය නැත අද

අපේ මංගල රාත්‍රියේදී
රමණ සුවයෙන් ඔකඳව
තුරුලට ගත් විට නුඹව
ඉගිළෙන්න තැත් දැරූ
හංස ජෝඩුව නැත අද

කිරි ඉල්ලා පුතු හඬන විට
දිවියම පසෙක දා දුවවිත්
උකුලේ හොවාගෙන පුතුව
බඩගිනි නිවා ඔහු සැනසූ
කිරි දුන් පියයුරු නැත අද

රෝහලට යන විට
මහත් වේදනාවක් නුඹට දී
මස් වැදලි දෙකක් ලෙස වෙන් ව ගිය
ඒ පිළිකා පියයුරු නැතත්
සදා කල් නුඹ මගේ හංස ධේනුව

**ශක්තික සත්කුමාර**

